සහගතවූවත් රටේ ප්‍රජාතන්ත්‍රවාදය අවදානමේ තිබුණු සෑම අවස්ථාවකම ඒ අවදානම මගහරවන්නට අපි මැදිහත් වෙලා තිබෙනවා. 2017 වසරේ දී, එවක ජනපති මෛත්‍රීපාල සිරිසේන ප්‍රජාතන්ත්‍රවිරෝධීව එදා හිටපු අගමැතිවරයාව බලයෙන් පහකර, ඒ වෙනුවට මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ආණ්ඩුවක් පිහිටවූ අවස්ථාවේ ඒ ප්‍රජාතන්ත්‍ර විරෝධී හැසිරීමට එරෙහිව අපි සටන් කළා. රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා හැටියට පත්වුණේ එහි ප්‍රතිඵලයක් හැටියට. ඒක දේශපාලනමය වශයෙන් අපිට අවාසි සහගත වුනත් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අපි ඒ දෙය කළා. මෛත්‍රීපාල සිරිසේන පාර්ලිමේන්තුව විසිරුවා හැරියා. අපි ඒකට විරුද්ධවත් සටන් කළා. අපි ඒක අධිකරණය ඉදිරියට ගෙන ගියා. හිටපු ජනපතිවරයාගේ ඒ කටයුත්ත අනීතික බවට අධිකරණයෙන් තීන්දුවක් ලබාගත්තා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අපි මැදිහත් වෙලා තිබෙනවා.

2001 වසරේ 17 වෙනි ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළ අවස්ථාවේ එවක තිබුණු චන්ද්‍රිකා ජනපතිනිය ප්‍රමුඛ ආණ්ඩුවට බහුතරයක් තිබුණේ නැහැ. ජී.එල් සහ එස්.බී ප්‍රමුඛ පිරිසක් එක්සත් ජාතික පක්ෂයට පිල් මාරු කර තිබීමයි ඒකට හේතුව වුණේ.

අපිට මන්ත්‍රීවරු 10ක් හිටියා. 17 වෙනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන්නට ආණ්ඩුවට වසරක කාලයක් ආධාර කරන්න අපි ඉදිරිපත් වුණා. මේ සංශෝධනය තමයි එතෙක් රටේ ව්‍යවස්ථාවට සිදුවෙලා තිබුණු වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීම සංශෝධනය. 2010 වසරේ බලයට පත්වුණු මහින්ද රාජපක්ෂ එය ගලවා ඉවත් කළා. එතකොට ඔහු ප්‍රජාතන්ත්‍රවාදී යි. අපි ප්‍රජාතන්ත්‍රවාදී නැහැ. නැවතත් 2015 වසරේ දී, රටේ ව්‍යවස්ථාවට 19 වෙනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන්නට අපි විශාල දායකත්වයක් ලබාදුන්නා. ඒ සංශෝධනයත් 2020 වසරේ ඉවත් කෙරුණා. මේ ඔක්කොම බලපුවහම අපි ඇවිල්ලා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කරපු පක්ෂයක්.

ප්‍රජාතන්ත්‍රවාදීය කියන මේ නායකයෝ අධිකරණ තීන්දුවලට ගරු කරන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ අධිකරණයට සෘජුවම තර්ජනය කරනවා. නමුත් ඔහු ප්‍රජාතන්ත්‍රවාදී යි. අපි ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මොන තරම් කැපවීම් කර තිබෙනවාද යන්න පසුගිය වසර 30ක කාලය පුරාවට ක්‍රියාවෙන්ම පෙන්වා දී, තිබෙනවා. 1998 සහ 2000 මැතිවරණවල දී, අපේ සහෝදරවරු ඝාතනය වුණා. නමුත් ඔවුන් අපිට දිගටම කියන්නේ අපේ පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී නැතිය කියා. අපි අඩුම තරමේ ගලක්වත් විසිකරලා නැහැ. අපි ඇවිල්ලා වෙන කිසිම දේශපාලන පක්ෂයකට වඩා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ලොකුම දායකත්වයක් ලබාදුන්නු සහ ඒ බව ක්‍රියාවෙන්ම පෙන්වා දී, තිබෙණ පක්ෂයක්.

**ප්‍රශ්නය - ඔබ ප්‍රජාතන්ත්‍රවාදී බව ඔබ නැවත නැවතත් කියනවා. ඒත් ඔබේ පක්ෂ සාමාජිකයන් ගැන කොහොමද? පහුගිය මාස කිහිපය ගත්තොත් ඔවුන් සමහර අය ඉතාම ආන්දෝලනාත්මක ප්‍රකාශ සිදුකරලා තිබෙනවා. ඔවුන් ඔබ කියන විදිහට වැඩ කරයි ද, නැත්නම් ඔවුන් තම තමන්ගේ ස්ථාවරවලට අනුව ද, වැඩ කරන්න යන්නේ?**

අපේ දේශපාලන පක්ෂය ඉතාම දැඩිව ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙත් අභ්‍යන්තරිකව අනුගමනය කරන දේශපාලන බලවේගයක්. අපි ගන්නා සෑම තීරණයක්ම ගන්නේ අදාළ ව්‍යුහයන් ඇතුලේ සාකච්ඡා වට ගණනාවක් තියලා. ඔය කියන ප්‍රකාශ මගේ පෞද්ගලික මතය නෙවෙයි. හැබැයි, සාකච්ඡාවලින් අපි ඔක්කොම එකම මතයකට එනවා. එකඟ වෙනවා. නමුත්, අපේ අදහස් ප්‍රකාශ කිරීමේ දී, ඉදහිට ඇතැම් ගැටලුවලට මුහුණදෙන්න අපට සිදුවෙලා තියෙනවා. මේ තත්ත්වය අපේ පක්ෂයෙන් විතරක් පෙනෙන දෙයක් නෙවෙයි.

අපේ අදහස් ඉදිරිපත් කිරීම්වල ගැටලු පවතිනකොට ඇතැම් මාධ්‍ය ආයතන එම අදහස්වල සැබෑ අරුත විකෘතිවන ආකාරයෙන් තමයි වාර්තා කිරීම් කළේ. අපිත් මිනිස්සු. වැරදි වෙනවා. නමුත් අපේ වගකීම ඒ වැරද්ද නිවැරදි කරගන්න එක. සහ, අපි ඒ දේ කරනවා. ඔබ අනෙක් දේශපාලන පක්ෂ දිහා බලන්න. වේදිකාවල ඔවුන් කියන දේවල් විතරක් නෙවෙයි, ඔවුන් කරන දේවලුත් බලන්න.

ඔවුන් පාර්ලිමේන්තුවට පිහි අරගෙන එනවා. මිරිස් කුඩු අරගෙන එනවා. ඔවුන් පාර්ලිමේන්තුව ඇතුලේ ගහගන්නවා, ඇසැබි වචන කියනවා. ඔය දේවල්වලින් සියයට එකක ප්‍රතිශතයක් අපි කළානම් කොහොම ද? ජනතාව හිතන්නේ ඒ අය ඔය දේවල් කළාට කමක් නැහැ කියලා. ඒ අය ඔය විදිහට හැසිරේවි කියලත් ජනතාව බලාපොරොත්තු වෙනවා. ඒ අය හොරකම් කළත්, නීති කැඩුවත්, අධිකරණ නියෝග තුච්ඡ දෙකට දැම්මත්, බරපතල වංචාවල වැරදිකරුවන් වෙලා හිරබත් කන්න වුනත් ඒක ලොකු වැරද්දක් හැටියට ජනතාව දකින්නේ නැහැ. හැබැයි, කතා කරන්න ගිහිල්ලා යන්තම් අපේ දිව පැටලුනොත්, ඔන්න ජනතාව ඒක ඉතාම බරපතල විදිහට ගන්නවා. ඉතින්, අපිට නම් හිතෙන්නේ අපි වඩා වගකීම් සහගව සහ පිරිසිදුව කටයුතු කරාවිය කියා ජනතාව අපෙන් අපේක්ෂා කරන බවක්. ඒ අපේක්ෂාව වෙනුවෙන් අපි පෙනී සිටිනවා.

**ප්‍රශ්නය - ජනතා විමුක්ති පෙරමුණ ප්‍රචණ්ඩත්වයට අනුග්‍රහය දක්වන බවට හෝ ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කරමින් සිටින බවට අරගල සමයේ දී, චෝදනා නැගුණා. මට මතකයි විරෝධතාකරුවන් පාර්ලිමේන්තුව පිටත රැස්වූ අවස්ථාවේ ජනතා විමුක්ති පෙරමුණේ ආශිර්වාදය ලැබූ කණ්ඩායම් පාර්ලිමේන්තුවට කඩා වැදී එය අත්පත් කරගන්නට උත්සාහ කළ බවටත් චෝදනා එල්ල වුණා. මහින්ද රාජපක්ෂ ඉල්ලා අස්වූ මැයි 9 වෙනිදා සජිත් ප්‍රේමදාස අරගල භූමියට පැමිණි අවස්ථාවේ විරෝධතාකරුවන් ඔහුට පහර දුන්නා. නමුත් ඔබ ආ විට කිසිවෙක් ඔබට අතවත් තැබුවේ නැහැ. එහෙම වුණේ කොහොම ද?**

මුලින්ම කියන්න ඕන, මැයි 9 වෙනිදා සිදුවීම ගැන ප්‍රමිත බණ්ඩාර කිව්වේ මොකක් ද? ගාලුමුවදොර පිටියේ හිටපු විරෝධතාකරුවන්ට පහර දෙන්නට ගත්තු තීරණය ඔහු සමාන කළේ වෙනම අපේක්ෂකයෙක් මැතිවරණයට ඉදිරිපත් කරන්න ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ගත්තු තීරණයට. ඒ කියන්නේ, පැහැදිලියි, විරෝධතාකරුවන්ට පහර දෙන්න ඔවුන් තීරණය කර තිබූ බව. මැයි 9 සිදුවීමේ ප්‍රතිඵලයක් හැටියට තමන්ගේ දේපළවලටත් හානි සිදුවූ බව එස්.එම්.චන්ද්‍රසේනත් කියා සිටියා. ඉතින් එහෙම බලපුවහම, මහින්ද රාජපක්ෂ මේ සිදුවීමේ පළමු චූදිතයා බවට මේ කඳවුරෙන්ම පත්කරලා තියෙනවා. ඔබ එදා ජනතාවගේ තිබුණු මානසික තත්ත්වය අවබෝධ කරගත යුතුයි. ගෝඨාභය රාජපක්ෂ ඉල්ලා අස්විය යුතු බවට සමාජයෙන් ඉතාම ප්‍රබල හඬක් නැගෙමින් තිබුණා. එයින් පස්සේ ඒ බලපෑම එල්ල වෙන්න ගත්තේ රාජපක්ෂවරුන් සියලු දේශපාලන බලය අතහැරිය යුතුයි යන්නට. ගාලුමුවදොර හිටපු විරෝධතාකරුවන්ට දේශපාලනයේ, ධනවත් හෝ දුගී බවේ කිසිම වෙනසක් නැතුව රටේ සියලුම ජනතාවගේ ආශිර්වාදය ලැබී තිබුණා. ඒ ස්ථානයට පහර දීම ඔවුන්ව කම්පනයට පත්කළා. ඔවුන් ඒ කම්පනය තම තමන්ට දැනුණු විදිහට පිට කළා. මැයි 9 සිදුවීම් සමග අපේ කිසිම සම්බන්ධයක් නැහැ. මැයි 9 සිදුවීම් හා සම්බන්ධ යැයි අත්අඩංගුවට ගෙන සිටින පුද්ගලයින්ගේ දේශපාලන පසුබිම අනාවරණය කරන්නයය කියා මම ආණ්ඩුවට කියනවා. ඔවුන්ගෙන් 90%කට වැඩි පිරිසක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ දේශපාලන පසුබිමක් තියෙණ අය.

දෙවනියට ඔබ ඇහුවා ඇයි සජිත්ට පහර දුන්නේ සහ මට පහර නොදුන්නේ කියා. ගාලුමුවදොර විරෝධතාවය කියන්නේ මොකක් ද? රටේ සාමාන්‍ය පුද්ගලයෙක්ට ඉහළින් සිටින, අධි සුඛෝපභෝගී වාහනවලින් ආරක්ෂකයින් පිරිවරාගෙන යන මන්ත්‍රීවරුන්ට එරෙහිව යි ගාලුමුවදොර විරෝධය පැන නැගුණේ. ඒක තමයි ගාලුමුවදොර අරගලයේ සංකේතය.

සජිත් ප්‍රේමදාස අරගල භූමියට ගියේම ඒ විදිහට. ඔහු එහි ගියේ ඉතාම මිල අධික වාහනයක නැගීගෙන, ආරක්ෂකයින් පිරිවරාගෙන. ඔහු ගියේ අරගලයට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ ප්‍රතිරූපයකින්. ඒ නිසාම විරෝධතාකරුවන් ඔහුට පහර දුන්නා.

විරෝධතාකරුවන්ගේ සහ මගේ බලාපොරොත්තු එක වගේ. ඔවුන් දේශපාලකයෙකුගෙන් අපේක්ෂා කරන හැසිරීම මට තියෙනවා. ඉතින්, මට පහර දෙන්න කිසිම හේතුවක් තිබුණේ නැහැ. ඒ වගේම තුන්වෙනියට, ජනතාවගේ මේ විරෝධය ජයග්‍රහණයකින් අවසන් වුනොත් වහාම පාර්ලිමේන්තුව විසිරුවා හැරිය යුතු බවට දැඩි මතයක් අපට තිබුණා. ජනපතිවරයා බලයෙන් පහකළා වුනත්, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබුණු නිසා අලුත් ජනපතිවරයෙක් පත්කරගන්න ඒ අයට අවස්ථාව පැවතුණු නිසයි අපි එහෙම මතයක හිටියේ. ඒ නිසාම අපි පාර්ලිමේන්තුව ආසන්නයේ විරෝධතාවක් පැවැත්වුවා. නමුත් ඇතැම් පිරිස් පැමිණ එහි කටයුතු කඩාකප්පල් කරන්න උත්සාහ කළා. ඒ නිසා අපි අපේ සාමාජිකයන්ව එම ස්ථානයෙන් ඉවත් කරගත්තා. අවසානයේ පාර්ලිමේන්තුව විසිරුවා නොහැරුණු නිසා ජනතාවගෙන් ප්‍රතික්ෂේප වුණු දේශපාලන සංස්කෘතියම නැවතත් ස්ථාපිත වුණා. සොරා කෑම, වංචා සහ දූෂණ, අධිකරණ නියෝග නොසළකා හැරීම අදටත් ජයටම සිදුවෙනවා. පාර්ලිමේන්තුව විසිරුවා හැරීමක් සිදුනොවුණු නිසා අරගලයෙන් ලැබුණේ අර්ධ ජයග්‍රහණයක් විතරයි. ඉතින්, මේ ජනපතිවරණයේ දී, ඒ ඉතිරි අර්ධය සම්පූර්ණ කරගත හැකිවේය කියා අප හිතනවා.

> එක දෙයක් තමයි, 1988 සහ 89 සිදුවීම් ඉබේ පහළ වූ සිදුවීම් නොවීම. ඒවා එක්තරා දේශපාලන ගමනක නිර්මිතයන්. 1978 වසරේ අතුරු මැතිවරණයක් පැවැත්වුණා මැතිවරණ කොට්ඨාස 4ක. අපි ඒ මැතිවරණයට ප්‍රජාතාන්ත්‍රිකව තරග කළා. 1981 වසරේ පැවැත්වුණු සංවර්ධන කවුන්සිල මැතිවරණයටත් අපි තරග කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒ මැතිවරණය වර්ජනය කළ පසුබිමක. 1982 ජනපතිවරණයත් අපි තරග කළා. ජනමත විචාරණයක් හරහා පළාත් සභා මැතිවරණ කල්දැමීමට එරෙහිව අපි නැගී සිටියා. ඒ නිසා, අපි හැම අවස්ථාවකම ඉතාම ස්ථිරසාරවම ගමන් කරලා තියෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී මාවතක.

**ප්‍රශ්නය - සොරා කෑම, වංචා, දූෂණ අදටත් සිදුවෙමින් තිබෙණ බව ඔබ කියනවා. හැබැයි මැතිවරණ ආසන්න වෙනකොට අනුර කුමාර දිසානායක ෆයිල් සහ ලියකියවිලි තොගයක් අරගෙන මාධ්‍ය ඉදිරියට ඇවිත් මේ තියෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එරෙහිව පවතින දූෂණ චෝදනා ය කියනවා අපි අවස්ථා කිහිපයකදීම දැක්කා. නමුත් අද වෙනකන් අපි මේ ෆයිල්වල තියෙන්නේ මොනවාද කියන එක දන්නේ නැහැ. අනෙක නිකන් මැජික් එකක් වගේ මැතිවරණ ඉවර වෙනකොට ෆයිල් ටිකත් අතුරුදහන් වෙනවා. මේ සැරෙත් අපි දැක්කා රනිල් වික්‍රමසිංහගේ ෆයිලුත් මම ළඟ තියෙනවාය කියා ඔබ පවසනවා. රනිලුත් ඔබට ප්‍රතිචාර දැක්වූවා මේ කියන ෆයිල් ඔබ ළඟ තියෙන්න පුළුවන් වුනාට ඒවා ඇතුලේ තියෙන**